# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන)

**(122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

[230 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6.00 යි තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## නීතියේ බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් (122 වන අධිකාරිය වූ) (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඇටෝර්නි බලපත්‍ර ආඥා පනතේ 9 වන වගන්තියේ සඳහන් උපලේඛනයේ ගාස්තු ප්‍රතියෝජනය කිරීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***3 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් වගන්තියක් ලෙස 10 වගන්තිය එකතු කරනු ලබන අතර එයින් අමාත්‍යවරයාට නියෝග සෑදීමට බලය පවරනු ලැබේ.

**එල්.ඩී.—ඕ. 19/2013**

**(122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2013 අංක          දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත ලෙස හඳුන්වනු ලබන අතර, 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥා පනතේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥා පනතේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"ගාස්තු "    9 පහත දැක්වෙන ගාස්තු හෝ අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් යම් මුදලක් මේ ආඥාපනත යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

| | රු. ශත. |
|---|---|
| යම් ඇටෝර්නි බලපත්‍රයක් ලියාපදිංචි කිරීම සඳහා | 1,500. 00 |
| ලියාපදිංචි කරන ලද යම් ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම පිළිබඳ යම් නිවේදනයක් ලියාපදිංචි කිරීම සඳහා | 1,500. 00 |
| ලේඛන සෝදිසි කිරීම පිළිබඳ සෑම ඉල්ලීමක් සඳහා | 500. 00 |

| | රු. ශත. |
|---|---|
| ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයක සහතික පිටපතක් සඳහා වූ සෑම ඉල්ලීමක් සඳහා | 500. 00 |
| 7 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන පත් ඉරු යටතේ වූ සෑම සහතික පිටපතක් සඳහා | 500. 00” |

ප්‍රධාන ප්‍රඥප්තියට 10 අලුත් වගන්තිය එකතු කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය එකතු කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතුය.

“ නියෝග”

(1) මේ පනතේ ප්‍රතිපත්ති හෝ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා ද, නියම කළ යුතු යයි විශේෂයෙන් මේ පනත යටතේ නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් ද, අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරෙන බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, පහත සඳහන් සියලු හෝ යම් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :-

(අ) මේ පනත යටතේ වූ යම් කාරණයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු ;

(ආ) මේ පනත යටතේ වූ යම් කාර්යයක් සඳහා භාවිතා කල යුතු ආකෘති පත්‍ර.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එය පළකරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කල හැකි පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබීමෙන් පසු, හැකිතාක් ඉක්මණින් එය අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සැලකිය යුතුයඃ-

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ අවලංගු කරන ලද සේ සැලකිය යුත්තේ යම් දිනයක සිට ද, ඒ දිනය දැක්වෙන නිවේදනයක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

වලංගු භාවය සහ හානිපූරණය.

**4.** 2013 ජනවාරි මස 1 වන දින සිට ආරම්භව 2013 මාර්තු මස 31 වන දිනයෙන් අවසන්වන කාලය දක්වා අයකිරීම සඳහා හෝ එකතු කිරීම සඳහා මේ පනත මගින් බලය දී ඇති යම් කාර්යයක් සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහුවෙනුවෙන් නැතහොත් මේ පනත යටතේ බලය පවරන යම් තැනැත්තකු විසින් අයකරනු ලබන හෝ එකතු කරනු ලබන යම් ගාස්තු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ මේ පනත යටතේ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් වලංගු ලෙස අය කරනු ලැබ හෝ එකතු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත කී විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ දී අයකරනු ලබන හෝ එකතු කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් කරනු ලබන තීරණයකට හෝ නියෝගයකට නැතිනම් යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නඩු කටයුතු සඳහා බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.